**අංක 170.]**

**(දසවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)**

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2026 අගෝස්තු 05 බදාදා පූ.භා. 9.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

660/2025

ගරු රෝහණ බංඩාර මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ දියර කිරි නිෂ්පාදනය වාර්ෂිකව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම කාලසීමාව තුළ දේශීය කිරි අවශ්‍යතාවය, ආනයනය කර ඇති කිරි ප්‍රමාණය සහ ඒ සඳහා වැය කොට ඇති මුදල් ප්‍රමාණය කොපමණද;

(iii) දියර කිරිවලින් රට ස්වයංපෝෂිත කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

985/2025

ගරු කිංස් නෙල්සන් මහතා,— විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2010 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් පුහුණු කිරීම මඟින් උපයා ඇති ආදායම කොපමණද;

(ii) එම ආදායම උපයන මාර්ග කවරේද;

(iii) එම කාල සීමාව තුළ කාර්යාංශයේ පුහුණුව ලබා විදේශගතවූ සහ එම පුහුණුව නොලබා විදේශ ගතවූ ශ්‍රමික සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) පළමු වතාවට විදේශගත වන සෑම ශ්‍රමිකයෙකුටම කාර්යාංශය මඟින් පුහුණුවක් ලබා දීම අනිවාර්ය කිරීම වැදගත් බැවින්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

1634/2025

ගරු චාමර සම්පත් දසනායක මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ත්‍රිවිධ හමුදාව තුළ ස්ථිර සහ තාවකාලික සේවයේ යෙදී සිටින හමුදා සාමාජිකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) පසුගිය වර්ෂ 05 තුළ ඔවුන්ට නීත්‍යානුකූලව හමුදා සේවයෙන් ඉවත්වීම සඳහා පොදු සමා කාලයක් ලබා දුන් වාර ගණන කොපමණද;

(iii) එම පොදු සමා කාල තුළ නීත්‍යානුකූලව හමුදා සේවයෙන් ඉවත්වූ හමුදා සාමාජිකයන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

2107/2026

ගරු එම්.ඒ.සී.එස්. චතුරි ගංගානි මහත්මිය,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උඩවලව ජාතික වනෝද්‍යානය සහ ලුණුගම්වෙහෙර ජාතික වනෝද්‍යානය අතර පිහිටි අලි කොරිඩෝව ගැසට් කරන ලද දිනය කවරේද;

(ii) කොරිඩෝව දෙපස ආරක්ෂිත විදුලි වැට ස්ථාපනය කරන ලද දිනය කවරේද;

(iii) මෙම විදුලි වැට ඉදිකිරීමේ මූලික අරමුණ කවරේද;

(iv) අලි වැට ඉදිකිරීම සඳහා දරා ඇති මුළු පිරිවැය කොපමණද;

(v) 2018 වර්ෂයේදී අලිවැට තිබියදීත් උදෑසන කාලයේ ගම්වැදුණු අලියෙකු විසින් පාසල් දරුවෙකු මරණයට පත් කළ බව දන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අලි කොරිඩෝව දෙපස ස්ථාපනය කර ඇති විදුලි වැටෙහි බලහරුව ගම්මානය ආවරණය වන කොටසෙහි ප්‍රධාන විදුලි වැට මේ වනවිට අක්‍රියව පවතින බව දන්නේද;

(ii) එම විදුලි වැට ඉවත් කිරීම සඳහා තීරණයක් ගෙන තිබේද;

(iii) එසේ නම්, එම තීරණය ගත් දිනය සහ අරමුණ කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

2135/2026

ගරු ඔෂානි උමංගා මහත්මිය,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බණ්ඩාරගම, මිල්ලනිය සහ හොරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුළ පිහිටි ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එම ඉඩම්වලින් මේ වනවිට ප්‍රදානය කර ඇති ප්‍රමාණය කොපමණද;

(iii) එම ඉඩම්ලාභීන්ගේ නාම ලේඛනයක් ලබා දෙන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අනවසරයෙන් අත්පත් කරගෙන හෝ භාවිතා කරනු ලබන කොමිෂන් සභාව සතු ඉඩම් හඳුනාගෙන තිබේද;

(ii) එසේ නම්, එම ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) ඒ සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) ඉහත එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ —

(i) බදු පදනම මත ලබාදී ඇති කොමිෂන් සභාව සතු ඉඩම් ප්‍රමාණය සහ ඒ වෙනුවෙන් වාර්ෂිකව අය කරනු ලබන බදු මුදල;

(ii) බදු ගිවිසුම් පවතින නමුත් බදු මුදල් අයකර නොගන්නා ඉඩම් ප්‍රමාණය;

(iii) බදු ලබාදීම සඳහා පවතින නිරවුල් ඉඩම් ප්‍රමාණය;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## ප්‍රධාන වැඩකටයුතු ආරම්භයේ දී

**යෝජනා පිළිබඳ දැනුම්දීම**

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම්,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.30 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.00 සිට අ.භා. 5.30 දක්වා ද විය යුතු ය. පූ.භා. 11.30ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8(5) ක්‍රියාත්මක විය යුතු ය. අ.භා. 5.30ට කථානායකවරයා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

---

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

*1.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය,— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2026 අගෝස්තු 04),— "ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153(1) සහ 41ඇ(1) ව්‍යවස්ථා ප්‍රකාරව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමැතිය අනුව, 2026.02.05 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි එල්.එස්.අයි. ජයරත්න මහත්මිය විගණකාධිපති වශයෙන් පත් කර ඇති හෙයින්ද;

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ව්‍යවස්ථාව ප්‍රකාරව විගණකාධිපතිවරයාගේ කාර්යය හා කර්තව්‍යයන් නිශ්චය කර ඇති අතර, වැටුප ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153(2) ව්‍යවස්ථාව ප්‍රකාරව පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබිය යුතු අතර, රජයේ ඒකාබද්ධ අරමුදලට වැය බරක් වන හෙයින්ද;

ජනාධිපතිවරයා විසින් 2026.06.20 වැනි දින ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශයට අදාළව අංක අමප/26/1258/801/020 හා 2026.07.06 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව විගණකාධිපති, එල්.එස්.අයි. ජයරත්න මහත්මියට පහත පරිදි වැටුප් ගෙවීමට අනුමැතිය ලබා දී ඇති හෙයින්ද:—

(අ) විගණකාධිපති එල්.එස්.අයි. ජයරත්න මහත්මිය එම තනතුරට පත් කළ 2026.02.05 දින සිට ක්‍රියාත්මක වන පරිදි රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 අනුව SL-4 වැටුප් කේතයේ (175,000-12x5,300-238,600) 5 වන වැටුප් පියවරෙහි පිහිටුවා, ඒ අනුව එම චක්‍රලේඛයේ උපලේඛන II අනුව රු. 196,200/-ක වැටුප් පියවරට අනුරූපීව උපලේඛන III ට අනුව රු. 170,528/- වැටුප් පියවරෙහි පිහිටුවා වැටුප් ගෙවීමට; සහ

(ආ) එම වැටුප් පරිමාණයේ සඳහන් පරිදි වාර්ෂික වැටුප් වර්ධක ගෙවීමට සහ උක්ත චක්‍රලේඛයේ කලින් කල සිදු කරනු ලබන සංශෝධනයන්ට යටත්ව වැටුප පරිවර්තනය කිරීමට.

ඊට අනුකූලව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153(2) ව්‍යවස්ථාව ප්‍රකාරව, විගණකාධිපති එල්.එස්.අයි. ජයරත්න මහත්මිය වෙත රජයේ ඒකාබද්ධ අරමුදලට වැය බරක් වන පරිදි ඉහත සඳහන් පරිදි මාසික වැටුප් ගෙවීම කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව නිශ්චය කරයි.'' යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

*2.

සත්ව (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*3.

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*4.

ශ්‍රී ලංකා වරලත් මාධ්‍ය වෘත්තිකයන්ගේ ආයතනය පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*5.

ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයින් සේවයෙහි යෙදවීමේ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*6.

පදිංචිකරුවන් ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

ගෙවල් කුලී (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය. (2025 සැප්තැම්බර් 24) [1].

*9.

විදුලිසංදේශ බදු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*10.

මුදල් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*11.

බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ නීති විරෝධී රැඳවුම් ස්ථාන හා වධකාගාර පිහිටුවා පවත්වාගෙන යාම පිළිබඳ පරීක්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව,— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2025 අප්‍රේල් 10),— “2025 මාර්තු 14 දින පාර්ලිමේන්තුවේ දී සභාගත කරන ලද බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ නීති විරෝධී රැඳවුම් ස්ථාන හා වධකාගාර පිහිටුවා පවත්වාගෙන යාම පිළිබඳ පරීක්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව පාර්ලිමේන්තුව විසින් සලකා බලනු ලැබිය යුතු ය.” යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

12.

පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

13.

ශ්‍රී ලංකා පහසුකම් කළමනාකරණ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

14.

ඉඩම් සංවර්ධන (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

15.

කෝදාගොඩ ගුණරතන නාහිමි පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

16.

ට්‍රෙඩ්සෝ සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

17.

ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

[1]

"පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතු ය" යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

---